# තුම්මුල්ලෙ පද්මේ ඕස්ට්‍රේලියාවට

## කෑම ලෑස්තියි



"නිශාන්ත ජයකොඩි" හා **"කෑම ලෑස්තියි"** පිළිබඳවූ කතිකාව




ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද "දෙරණ" නාලිකාවෙන් විකාශනය වන **"ගිණි අවි සහ ගිණිකෙළි"** ටෙලි වෘත්තාන්තයේ කඳුල ද, වේදනාවද හොඳින් දත් මිනිසෙකු දේශපාලන භූමිකාවේ පාලකයින්, ඔවුනගේ රඟමඩලට නතු කරගනිමින්, පාදඩ සංස්කෘතියේ නියමුවකු ,රුදුරු මිනිසකු ලෙසට යොදා ගනිමින් **"තුම්මුල්ලෙ පද්මේ"** නම් වූ දාමරිකයා ලෙසට නම් කරන්නට වූ චරිතයක්... ඒ චරිතය එලෙසම පණපොවමින් අපූරු වූ රංගනයක යෙදෙන ප්‍රවීන රංගන ශිල්පී **"ශ්‍රියන්ත මෙන්ඩිස්"**



කල්දෙමුල්ල ගේ සටහනක්

**පසුගිය කාලය තුල සිඩ්නි හි ශ්‍රී ලාංකික ප්‍රජාව තුල එක්තරා කුතුහලයක් තිබුනා. "කෑම ලෑස්තියි" නොවරදවාම කන්න එන්න කියලා. මේක මොන වගේ දෙයක් ද යන්න හැම දෙනාම අතර ගැටළුවකට කතාබහට ලක්වුනා. ඒ එක්කම වාගේ එකිනෙකා අතර කසුකුසුවක් තිබුනා මේකට සම්බන්ධව ඉන්නෙ "ශ්‍රියන්ත මෙන්ඩිස්" නම් වූ නිර්මාණශීලී කලාකරුවාය කියලා. ඔන්න දැන් තමා වේලාව කෑම ලෑස්ති කරපු හැටි කියලා දෙන්න.**

ඇත්තටම...ඔය ප්‍රකාශය තුල ගැබ්වුන අන්දමේ දෙයක් ලාංකීය සමාජය තුල ඇතිවෙලා තියෙනවා. මොකද කෑම ලෑස්තියි කියලා කිව්වාම අපි ඉතාම ජනප්‍රිය ආකෘතියේ කුස පිරෙන ආහාරයක් ලබා ගැනීමට සූදානම් වචන පෙළක්. දැන් මේක මොකක්ද කියලා හොයලා බලන අවසථාවේ දී **"ශ්‍රියන්ත මෙන්ඩිස්"** සහභාගී වෙනවා නම් ප්‍රධාන සූපවේදියා ඔහුම වෙන්නැතියි කතාබහකුත් යෙදෙනවා. ඇත්තෙන් ම **"කෑම ලෑස්තියි"** කියන කතන්දරයේ අර්ථය ලංකාවේ වර්තමාන ව්‍යුහය තුල නිර්මාණය වූ සුවිශේෂී නාට්‍යයක්. නාට්‍යයකට මෙය සුදුසු ද නැද්ද යනවග ප්‍රේක්ෂකාගාරය තීරණය කල යුතු කාරණයක්.

කෙසේ වෙතත් නාට්‍ය කරුවන් හැටියට මෙය එළිත් යමක් කිරීමේ සෙවිල්ලේ සිතුවිල්ලේ අරමුණින් කළාවූ නිර්මාණයක්. මේ සෙවිල්ලේ එක් අරමුණක් හැටියට තමා **"කෑම ලෑස්තියි"** කියන නාට්‍යයට අපි අවතීර්ණවෙන්නෙ. මෙහි ප්‍රධාන භූමිකාව නිර්මාණය කරන්නට වන්නේ මා අතින්. එම ප්‍රධාන භූමිකාවේ චරිත 5 ක් විතර නිරූපණය කරන්නට සිදුවෙනවා. මෙහි කතාකරන්නට පාදක කරගන්නේ ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජය තුල තිබෙනා වූ ප්‍රාදේශීය දේශපාලන ප්‍රවාහයේ ව්‍යුහය ගැන තමා. මේක කතා කල යුතුයි කියන තර්කය අපි සිතුව නිසා, මේක කතා කල යුතුයි කියන අදහස අපට හැගුන නිසා තමා මේ තේමාව පාදක කරගන්නෙ. නාට්‍යකරුවන් බොහෝ විට තමුන්ගෙ ප්‍රකාශන මාධ්‍ය වශයෙන් වේදිකාව යොදා ගන්නවා. ජනතාවට පණිවුඩයක් දෙන්නට, ජනතා මෙහෙවරක යෙදෙන්නට.

**"කෑම ලෑස්තියි" කියලා සිඩ්නි හි ප්‍රචාරණය කරන අවසථාවෙ දී CONDITONS APPLY කියා විශේෂ වූ යෙදුමක් භාවිතා කලා. මෙය අප කලේ ප්‍රචාරණ කලාවේ නව ආරකට කරන්නාද් කුතුහලය දනවන සැඟවුන අරුත් ඇති බව ඒත්තු ගැන්වීමටයි. පසුව මෙය නාට්‍යයක් යයි වැටහුණු සියල්ලන්ටම තේරුම් ගියා ඇතුලාන්තයේ බොහෝ දේවල් අඩංගු බව. පසුගිය කාලවකවානුවේ බොහෝ නිර්මාණ පෙළගැසුනා දේශපාලන කතිකාවන් මුල් කරගනිමින්, ප්‍රහසනාත්මක ව ඉදිරිපත් කිරීම් තුලින්. යම් යම් හේතූන් මත මේවා සාර්ථක වුනේ නැහැ බොහෝ විට. ඒ ප්‍රහසන නාට්‍යයත්, මේ නාට්‍යයත් අතර තියෙන්නා වූ සුවිශේෂීභාවය ගැන කතා කලොත්?**

මා හිතන්නේ...ප්‍රහසනය කිරීමේ කාර්යය මහත් අපහසුවූත්,සංකීර්ණවූත් විෂයයක්. මේ ප්‍රහසනය වේදිකාව මත නිරූපනය කිරීමේ දී ඒකට ගැලපෙන රංගන ශිල්පීන් අපට අවශ වෙනවා. එම නිසාම මගේ කල්පනාවේ හැටියට මා විශ්වාස කරන කාරණාවක් තමයි වේදිකාව ජයගත්,කුසලතා සපිරි ශිල්පී ශිල්පිණියන් මෙයට සහභාගී වෙනවා. ඉතා සාර්ථකව මේ ප්‍රහසනය කිරීමේ කාර්යය සමාජගත කරන්නට පුළුවන් වුනා. ප්‍රේක්ෂකාගාර හොඳින් වැළඳගත්තා. මෙතැන දී කලාකරුවා දෙවැනි ආණ්ඩුව කියලා තමා නිර්මාණය වන්නේ. රටක දෙවැනි ආණ්ඩුව වන්නේ කලාකරුවා. ඔවුනගේ ප්‍රකාශන ප්‍රේක්ෂකාගාරය මදක් ඉහලින් ගමන් කරනවා. තවත් විටෙක ඉදිරියෙන් ගමන් කරනවා. ඔහු කරන ප්‍රකාශනයන් ප්‍රේක්ෂකාගාරය පිළිගන්නට එකගවන්නට කැමතියි. ඒක නිසාම වර්තමානයෙ බොහෝ විට ප්‍රාදේශීය දේශපාලන ව්‍යුහය තුල පසුගිය කාලයේ සිදුවුන සිදුවීම් පෙළ අරඹයා කලාකරුවන් හැටියට අපටත් වේදිකාව මතින් ප්‍රේක්ෂකාගාරයට යම්කිසි පණිවුඩයක් දෙන්නට ඕනැකමක් තිබ්බා.

මේ පණිවුඩය එක පාරම යැව්වොත් අමු සහ අමිහිරි ගතියක් දැනෙනවා. ඒක නිසාම අපි හිතුවා මේක ප්‍රහසනයක් තුලින් ප්‍රේක්ෂකයින්ට යොමුකල යුතුය කියන විශ්වාසය. ඒ විශ්වාසය පදනම් කරගෙන තමයි **"කෑම ලෑස්තියි"** කියන වේදිකා නාට්‍යය නිර්මාණය වෙන්නේ. අද වෙනකොට ලාංකීය වේදිකාවේ දර්ශණ වාර 50 කට ආසන්නව මෙය වේදිකාගත වෙනවා. කොළඹ නගරය මෙන්ම ගම් නියම් ගම් සිසාරා වේදිකා ගත වූවත්, සෑම ප්‍රේක්ෂකයෙක්ම බොහෝ ප්‍රහසනයෙන් වැළඳගනිමින්,සිනහවෙන් තමුන්ගේ මනසට හදවතට තට්ටු කරමින් තමන් සිනාසෙන්නේ තමන්ටම නේදැයි හිතාගෙන තමා ශාලාවෙන් පිටව යන්නේ. මා හිතන්නේ ප්‍රහසනය තුලින් සිදුවිය යුත්තේ එයයි.

**විශේෂයෙන් ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාව ගතහොත් ඒකෙ යම්කිසි කොටසක් ඉන්නවා ශ්‍රී ලාංකික දේශපාලන ප්‍රවනතාවය පිළිබඳව නැත්නම් රටේ මොකක්ද වෙන්නේ කියලා දැඩි අවධානයකින් ඉන්න උදවිය. ඒ වගේම තව පිරිසක් ඉන්නවා ශ්‍රී ලාංකීය දේශපාලනය පිළිබඳව කිසිදු අවබෝධයක් නැහැ. මේ දෙපිරිසම ගත්තොත් රසවිඳීම පැත්තෙන් මොනවගේ අදහසක් ද හිතෙන්නේ.**

ඉතාමත් ම අවශ්‍ය වූත් නිවැරදි වූත් ප්‍රශ්නයක් ඔය අහන්නේ. මේ නාට්‍යයේ රසය බෙදාහදාන්නට පුළුවනි සකල ප්‍රේක්ෂකාගාරයටම. අවු 8 සිට 80 දක්වා. කුඩා දරුවනට විචිත්‍ර වූ බැවිනුත්, වැඩිහිටියනට අවබෝධය හා ප්‍රහසනය තුලිනුත් අවැසි රසය විඳින්නට පුළුවනි. බොහෝවිට මම රංගන ශිල්පියෙක් හැටියට සිඩ්න පුරවරයට නෑකම් කියනවා. ලෝකයේ බොහෝ රටවල කටයුතු කලත් වේදිකාව මත නිරූපන කලාවේදී බොහෝ නිරූපන කලාවන් සිදුවුනේ සිඩ්නි පුරවරයෙ. ඒකත් මේ අතරම කිව යුතුයි මට.

**ඔබ දන්නවා මේ"සන්නස"පුවත් පතත් ඕස්ට්‍රේලියාව පුරාම සංසරණය වෙනවා. එතකොට මේ නාට්‍යයේ දර්ශණයන් සිඩ්නි පමණක් නොවෙයි අනෙකුත් නගර වලත් පැවැත්වෙනවා. ශ්‍රී ලාංකික කලා රසය විඳගන්න ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාවට මේ නාට්‍යය නරඹන්නට කියා ඔබ ආරාධනා කරනවා. ඔවුනට කියන්නට තිබෙනාවූ ආදරණීය පණිවුඩය සඳහන් කළොත්?**

මෙහෙමයි අපි නාට්‍යයක් හැදුවට පස්සේ කොළඹ පෙන්වනවා. ඊලගට නුවර,නැත්නම් ගාල්ල ඊට පස්සේ මාතර,හලාවත,අනුරාධපුරය වගේ නගර ගණනාවක් අපට තිබුනා. දැන් අපි ඉන්නේ විශ්ව ගම්මානයක් තුල. මේ විශ්ව ගම්මානයේ දී අපි කොළඹ නාට්‍යයක් පෙන්නුවට පස්සේ ඊළගට පෙන්වන්නේ ඕස්ට්‍රේලියාවේ. බලන්න අපි මේ පුංචි ලෝකයෙනේ එකතුවෙලා ඉන්නෙ. මේ වෙනකොට ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන නගර සෑම එකකම වාගේ අපේ **"කෑම ලෑස්තියි"**.

**සිඩ්නි,කැන්බරා,මෙල්බර්න්,පර්ත්,ඇඩිලේඩ්,බ්‍රිස්බෙන්** වාගේ නගර වල. සියළුම පුරවරවල අපේ දයාබර ප්‍රේක්ෂකයිනට අපි ආරාධනා කරනවා එන්න අපිත් එක්ක එකතු වෙලා බුද්ධියේ හා ප්‍රහසනයේ වේල භුක්ති විඳින්නට කියා. රංගනයේ මම,**"ශ්‍රියන්ත මෙන්ඩිස්",මාදනී මල්වත්තගේ,ජනක කුඹුකගේ,වසන්ත විට්ටච්චි, කීර්ති කේ රත්නායක** වගේම අළුත් පරම්පරාවට එකතු වන **ප්‍රදීප් ඇරැගම**ත් සම්බන්ධ වෙනවා. සංගීත නිර්මාණය කලේ **සරත් කුලාංග**, රචනය සහ අධ්‍යක්ෂණය **අජිත් මෙන්ඩිස්**,නිෂ්පාදනය **ජුඩ් ශ්‍රීමාල්** ගෙන්. මේ සියළුම දෙනාගේ එකතුව **"කෑම ලෑස්තියි"**කියන ප්‍රහසනයට සෑහෙන පිටුවහලක් වුනා. **"කෑම ලෑස්තියි"** ඔබට ඔබගේ අතීතය,වර්තමානය,අනාගතය කියන කාරණා තුනම ශ්‍රී ලාංකීය දේශපාලන ව්‍යුහයේ ඇත්ත සහ තිත්ත හඳුනාගන්නට හොඳ අවසථාවක් වෙනවා.

**මෙ මගින් ඔබට රස බෙදන මා ප්‍රධාන සූපවේදී ශ්‍රියන්ත මෙන්ඩිස්**

---

**"කෑම ලෑස්තියි"** 2014 අගෝස්තු 2 වන සෙනුරාදා සවස 6.30 ට සිඩ්නි හි කාර්ලින්ෆර්ඩ් රෝස්ලි ප්‍රජා ශාලාවේ දී. සහ ජූලි 19 සෙනසුරාදා මෙල්බන් හි රිංග්වුඩ් ජෝර්ජ්වුඩ් පර්ෆෝමිං ආර්ට් සෙන්ටර් හිදී සවස 5 ට